# දේශීය ඥානය කළමනාකරණය කිරීමෙහිලා පුස්තකාලයාධිපතිවරයාගේ භූමිකාව

ඩබ්. ඩබ්. එස්. ටී. වර්ණසූරිය සහ එච්. ඒ. එන්. ලක්මාලි
කැලණිය විශ්වවිද්‍යාලය

warnasooriyathrishala@gmail.com
gamini.nadee76@gmail.com

**ප්‍රමුඛ පද**

දේශීය දැනුම, පුස්තකාලයාධිපතිත්වය, දැනුම කළමනාකරණය, පුස්තකාලයාධිපතිගේ භූමිකාව

**හැඳින්වීම**

මිනිසා වූ කලී ස්වභාවයෙන් ම ගවේෂණශීලී සංචාරක සත්ත්වයෙකි. සංචරණයේ දී සිදුවන නිරන්තර ඥාන ගවේෂණය හේතුවෙන් දැනුම යන්න ගතික ස්වභාවයක් උසුලයි. පරිණාමවාදයේ මුල පටන් ශිෂ්ටාචාරගත වීම දක්වාත් වර්තමාන තාක්ෂණික සමාජ ක්‍රමය දක්වාත් මිනිසා විසින් සිදු කරනු ලැබූ කාර්යය නම් සාමාන්‍ය ජන ජීවිතයේ පැවැත්ම වෙනුවෙන් හා දැවෙන ප්‍රශ්න නිරාකරණය කිරීමෙහිලා විවිධ දෑ අත්හදා බලමින් නව දැනුමක් ලොවට දායාද කිරීම යි.

එලෙස ගොඩනගා ගත් දැනුම් පද්ධතීන් තම ජීවන පැවැත්මට අවශ්‍ය ආහාර, වාසස්ථාන, සෞඛ්‍ය සනීපාරක්ෂාව, කෘෂිකර්මාන්තය, විවේකය විනෝදයෙන් ගත කිරීම ආදී තම ජීවිතය හා අවියෝජනීයව බැඳී අංශ උදෙසා ගොඩනංවා ගැනීමට මිනිසා පෙලඹීමේ ප්‍රතිඵලය වූ කලී දේශීය ඥානයක් වත්මන් ලොවට උරුම වීම යි.

කිසියම් නිශ්චිත දේශීය ජන කොට්ඨාසයකට අයත් සාම්ප්‍රදායික ජීවන රටා පිළිබිඹු කරන දැනුම සහ සාම්ප්‍රදායිකව පවත්වාගෙන එන්නා වූ අදාළ සමාජයේ උන්නතිය වෙනුවෙන් ඒකරාශී කරන ලද දැනුමට සම්බන්ධිත විවිධ විධික්‍රම, නව සොයා ගැනීම්, ක්‍රියාකාරකම්හි ඉගෙනුම් ක්‍රම ඇතුළත් බුද්ධිමය ක්‍රියාවලියකින් උපන් දැනුම වනාහි දේශීය ඥානය ලෙස අර්ථ ගැන්වීමට ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (World Intellectual Property Organization) උත්සුක වී ඇත.

ගල් යුගය, එඬේර යුගය, ගොවි යුගය, හා නූතන කාර්මික යුගය වශයෙන් ද විකාශනය වූ සමාජ සංස්ථාව තුල තමන් ලද අත්දැකීම් ද, අත්හදා බැලීම් ද යන්ත්‍ර, මන්ත්‍ර, කෙම් ක්‍රම, ආදී විධික්‍රම ද උත්සව, ක්‍රියාකාරකම්, වතාවත්, චාරිත්‍ර වාරිත්‍ර ද විවිධ භාෂා භාවිතය, හඬ අනුකරණයෙන් ද, උපකරණ, උපාංග වැනි සොයා ගැනීම්වලින් ද ලොවට පෙන්වා දෙන්නේ දේශීය ඥානයෙහි ඇති පොහොසත් බවකි. බොහෝවිට නිශ්චිත

Scanned with CamScanner

භූගෝලීය සීමාවක් තුළ නාගරීකරණයට ලක් නොවූ ග්‍රාමීය ප්‍රදේශ අළලා ගොඩනැගුණු දේශීය ඥානය විවිධ පරිසර පද්ධති, සමාජ කණ්ඩායම්, රටවල් හා සංස්කෘතීන්ට අනුගත වෙමින් අදාළ සංස්කෘතිය හා අවියෝජනීය සබඳතාවක් පවතින බව කිව යුතු ය. දෛනික අවශ්‍යතා අරමුණු කොටගෙන නිර්මිත වූවක් බැවින් මෙය පොත පතෙහි සඳහන් කිරීමට වඩා මුඛ වහරින් පරපුරින් පරපුරට දායාද කිරීමේ වැඩි නැඹුරුවක් දක්නට ලැබේ. තම බල පරාක්‍රමය මගින් පරිසරය හා ගැටීමට නොව පරිසරය හා සහජීවනයෙන් කටයුතු කරමින් පරිසර මිත්‍රශීලී වූ අවශ්‍යතා පූරණය කිරීමක් සිදුකර ඇතිබව දේශීය ඥානය පිළිබඳව විමසීමේදී දැකගත හැකිය. දීර්ඝ කාලීනව සිදුකරන ලද අත්දැකීම් ඔස්සේ ක්‍රමිකව ප්‍රත්‍යක්ෂ කර ගන්නා ලද අධ්‍යනයන්ගේ ප්‍රතිඵල සමුච්චයක් ලෙස මෙය හඳුනා ගත හැකිය. වර්තමානයේ ඉගෙනුම් ක්‍රමවේදයක් ලෙස ගැනෙන වැරදි හඳුනා ගනිමින් ඉගෙනීම හෙවත් (Trial And Error Method) ක්‍රමවේදයෙහි මූලාරම්භය දේශීය ඥානය හා බැඳුනක් බව පැහැදිලි ය.

ගෝලීයකරණය වැනි නූතන සංකල්ප තාක්ෂණික ලෝකය ඔපමට්ටම් කිරීමට ප්‍රබල දායකත්වයක් දැක්වුව ද එහි අතුරු විපාක ද නැතුවා ම නොවේ. ගෝලීයකරණය හමුවේ දේශීය සංස්කෘතිය, සභ්‍යත්වය හා අනන්‍යතාවට සිදු වී ඇති බලපෑම සම්බන්ධයෙන් ජාතික මෙන්ම ජාත්‍යන්තරයේ අවධානය යොමුව තිබීමෙන් පැහැදිලි වන්නේ අනර්ඝ වූ දේශීය දැනුම් පද්ධතිය සුරකීමෙහිලා ඇති වැදගත්කම යි. නමුත් එය යථාර්ථයක් කිරීමට ඇති ගැටලු සහ බාධා අතර දේශිය ඥානයේ වැදගත්කම පිළිබඳව අනවබෝධය, සංස්කෘතියක අඛණ්ඩ පැවැත්ම හා සංස්කෘතියේ අනන්‍යතාව ආරක්ෂාකර ගැනීමෙහිලා එය මතු අනාගතය උදෙසා ආරක්ෂාකර ගැනීමට අවශ්‍ය පියවර නොගැනීම, මේ සම්බන්ධව බලය පවරන ලද බල අධිකාරියක් හෝ නීති පද්ධතියක් ක්‍රියාත්මක නොවීම, පාරම්පරිකව මේවා දායාදකර ගැනීමට නූතන පරපුර දක්වන අකමැත්ත හා ඔවුන්ගේ ඍණාත්මක ආකල්ප, ජනමාධ්‍ය, රජය වගකිවයුතු අමාත්‍යාංශ, පර්යේෂණ මධ්‍යස්ථාන ආදී ආයතන මඟින් ප්‍රචාරණයක් ලබා නොදීම, බොහෝවිට මුඛ පරම්පරාගතව පැවතීම, මේ සම්බන්ධ පර්යේෂණ සිදුකිරීමට, ප්‍රවර්ධනයට හා බෙදාහැරීමට අවම මූල්‍ය ප්‍රතිපාදන ලැබීම, වෙනත් රටවල් බහු ජාතික සමාගම් හෝ ප්‍රතිවිරුද්ධ සංස්කෘතීන්, මේවා විනාශ කිරීමට ප්‍රයත්න දැරීම ආදී නොයෙකුත් හේතු කාරණා මත අදවන විට දේශීය දැනුම වියැකීයාමේ තර්ජනයට මුහුණ පා ඇති බව අප පිළිගත යුතුය.

උක්ත ගැටලු හා බාධා සම්බන්ධයෙන් අවධානය නොකිරීමෙන් ඉතා වටිනා පරිසර මිත්‍රශීලී ප්‍රායෝගික මෙන්ම ප්‍රත්‍යක්ෂ දැනුම් පද්ධතියක් අපට සම්පූර්ණයෙන් ම අහිමි වී යනු ඇත. ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ආයතන හා සංවිධාන වලට මෙන්ම සමාජ පද්ධතිය සමග නිරන්තර ගනුදෙනුවක යෙදෙන දායක පාර්ශ්වකරුවෙක් වශයෙන් පුස්තකාලයාධිපතිවරයාව හඳුනාගත හැකිය. දැනුම සොයා ගැනීම, ඒකරාශී කිරීම, ඒවා සංවිධානය, බෙදාහැරීම හා මතුපරපුර වෙනුවෙන් දායාද කිරීමේ මූලිකයා වශයෙන් ක්‍රියාකරන පුස්තකායාධිපතිවරයා විසින් අවබෝධ කරගෙන සිටිය යුතු කරුණක් වන්නේ පුස්තකාලයවල සාර්ථකත්වය රඳා පවත්වා ගැනීමට නම් එය පිහිටි රටේ සංස්කෘතිකාංග හා දේශීයත්වය සමඟ අඛණ්ඩ සබඳතාවක් ගොඩනගා ගත යුතු බව යන්නයි.

පුස්තකාලය තුළ ඇති දැනුම් කෝෂ්ඨාගාරය සංරක්ෂණය කිරීමේ භූමිකාවට පමණක් සීමා වී සිටි පුස්තකාලයාධිපතිවරයා සාම්ප්‍රදායික වූ දේශීය දැනුම සාම්ප්‍රදායික නොවන ක්‍රම උපායන් ඔස්සේ සමාජගත කිරීමට උත්සහ කිරීමේදී නිරායාසයෙන් ම ඔහුට

Scanned with CamScanner

කළමනාකරුවෙකුගේ භූමිකාව රඟ දැක්වීමට සිදුවනු ඇත. එහිලා දේශීය දැනුම නිශ්චිතව ම හඳුනාගැනීමත් ඒකරාශි කිරීමත් යන ප්‍රධාන කාර්යේ දී දේශීය දැනුමෙහි උරුමකරුවන් සමඟ ප්‍රථමයෙන් සමීප සබඳතාවක් ගොඩනගාගත යුතුය. කෘෂිකර්මය ආහාර තාක්ෂණය පේෂකර්මාන්තය, ඇදහිලි හා විශ්වාස, ජන සාහිත්‍ය වැනි එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළව කාර්යය මණ්ඩලයක් හෝ පර්යේෂකයනගෙන් යුක්ත ක්‍රියාකාරී කමිටුවක් පත්කොට එක් එක් ක්ෂේත්‍රය පිළිබඳව විෂය විශේෂඥතාවක් දක්වන කමිටු සාමාජිකයන් හඳුනාගෙන ඔවුන්ට එම ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා ඉඩ ප්‍රස්තා ලබා දෙමින් ඔවුන්ව අභිප්‍රේරණයට ලක්කළ යුතු ය. එකී විවිධ ක්ෂේත්‍රයන්ගේ තොරතුරු සම්මුඛ කරවා ගැනීමට අදාළ ප්‍රදේශයේ දේශීය දැනුම උරුමකරගත්තවුන් හමු වී සාකච්ඡා කිරීම කළ යුතු ම ය. එසේ ලබා ගන්නා දත්ත නිවැරදිව ගොනුකර ගැනීමට පුස්තකායාධිපතිගේ මැදිහත් වීම අත්‍යවශ්‍ය වේ.

ඉන් පසුව පුස්තකාලයාධිපති විසින් කළ යුත්තේ ඒකරාශී කරගත් දත්ත නිසි ලෙස විශ්ලේෂණය කොට සංවිධානය කිරීම යි, එය එක් එක් විෂයන් වශයෙන් වෙන්කොට දැක්වීම සුදුසු ය. ප්‍රාදේශීය, කලාපීය, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ද හඳුනාගත් තොරතුරු, භූගෝලීය මට්ටම් අනුව වුව වර්ග කිරීමට හැකි ය. මේවා කටවහරින් පැවතෙන්නක් වුවත් අදාළ පර්යේෂකයන් විසින් ලේඛන ගතකර මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රෝනික ස්වරූපයෙන් ඉදිරිපත් කිරීමේ අවස්ථා පවතී.

මීළඟ කර්තව්‍ය වශයෙන් සංවිධානය කළ දැනුම සමාජ ගතකරවීමේ බැරුම් හා අභියෝගාත්මක අවස්ථාවට පුස්තකාලයාධිපති තීක්ෂ්ණ බුද්ධියෙන් යුතුව මුහුණ දිය යුතු ය. එහිදී නූතන තාක්ෂණය යොදාගනිමින් වෙබ් පිටු නිර්මාණය, සමාජ ජාල කණ්ඩායම් ඇති කිරීම හරහා මේ පිළිබඳ උනන්දු වන්නන්ට විවෘත ආරධනාවක් කරමින් හෝ ලේඛනගත කොට හෝ සමාජගත කළ නොහැකි ඒවා බැවින් සාකච්ඡා, සංවාද, දේශන, ප්‍රසංග, උත්සව, සැමරුම්, දින ආදී අවස්ථාවල දී එම දැනුමෙහි සැබෑ උරුමකරුවන් එම ස්ථානවලට ගෙනැවිත් එම දැනුම සෙසු ප්‍රජාව උදෙසා ප්‍රායෝගිකව ම ව්‍යාප්ත කරලීම යි. ඔවුන් දිරිගැන්වීමක් වශයෙන් මෙන් ම ආර්ථික වාසි ලබා ගැනීමේ උපාය මාර්ගික සැලැස්මක් වශයෙන්ද සල්පිල්, ප්‍රදර්ශන කුටි ආදිය සංවිධානය කළ හැකිය. තම පුස්තකාල එකතුවෙහි එක් කොටසක් වශයෙන් ඡායාරූප එකතු ප්‍රදර්ශන භාණ්ඩ එකතු, දුර්ලභ ලේඛන හා වෙනත් විශේෂ එකතු වශයෙන් ඉදිරිපත් කරමින් පාඨක අවධානයට පත් කළ හැකිය.

වැළලී යන දේශීය දැනුම අනාගතයට දායාදකිරීමට නම් ඒවා සංරක්ෂණය කිරීම අනෙක් වැදගත් කාරණාවයි. ඩිජිටල්කරණය මඟින් ශ්‍රව්‍ය, දෘශ්‍ය, ශ්‍රව්‍යදෘශ්‍ය, ඡායාරූප, දත්ත පදනම්, වෙබ් අඩවි, පෝටල් ආදිය මඟින් තරුණ ප්‍රජාවේ උනන්දු ඇතිකරවා ගෙන මෙහි වැදගත්කම පෙන්වාදීම පුස්තකාලයාධිපති විසින් කළ යුතු ම ය.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය, සබරගමු විශ්වවිද්‍යාල පුස්තකාලය, වැදිජන උරුමය පිළිබඳ පර්යේෂණ පුස්තකාලය ඇසුරින් සිදුකළ මෙම පර්යේෂණය සඳහා එම පුස්තකාලයවල ප්‍රධාන පුස්තකාලයාධිපති ඇතුළුව සමස්ත කාර්ය මණ්ඩලයෙන් 70% සඳහා ප්‍රශ්නාවලී ලබාදීමත් පුස්තකාලයාධිපති හා සහකාර පුස්තකාලයාධිපත්වරුන් සමඟ සාකච්ඡා මාර්ගයෙන් ලබාගත් දත්ත MS Excel හරහා විශ්ලේෂණය කොට නිගමනවලට එළඹීමට හැකි විය.

එහිදී නිගමනය වූයේ තාක්ෂණික ලෝකය තුළ ගැටෙන කාර්යය බහුල පුස්තකාලයාධිපතිවරුන් තම පුස්තකාල එකතුව පවත්වාගෙන යනවා මිස එවා පෝෂණය

Scanned with CamScanner

කර නව උත්පාදන ඇති කිරීමට තම කාලය, ශ්‍රමය හා ධනය වැයකිරීමට පසුබට වන බවයි. නමුත් වියකී යන දේශීය දැනුම අදට වඩා මතු අනාගතයට ප්‍රයෝජනවත් විය හැකි බැවින් ඒවා කළමණාකරණය සහ සංරක්ෂණය උදෙසා පුස්තකාලයාධිපතිවරයා යන භූමිකාවට කළ හැකි කාර්යභාර්ය අතිවිශාල බව හඳුනාගත හැකි විය. ඇතැම් පුස්තකාලයාධිපතිවරු මේ සම්බන්ධව උනන්දුවක් දැක්වුවද අවශ්‍ය මාර්ගෝපදේශකත්වය, විද්වත් දායකත්වය, ජන මාධ්‍යවල දායකත්වය හා මූල්‍ය ප්‍රතිපාදනවල හිඟකම හේතුවෙන් නිසි සම්බන්ධීකරණ කටයුතු සිදු නොවීමෙන් මෙබඳු බරපතළ කර්තව්‍යයකට අතගැසීම ඔවුන්ට අභියෝගයක් වී තිබේ.

උක්ත බාධා අභියෝගයක් කරගනිමින් ඒවා ජයගැනීමට නම් පුස්තකාලයාධිපතිවරයෙකු වශයෙන් දේශීය දැනුමේ උරුමක්කරුවන් සමඟ ජන හඬක් නංවා නිදා සිටින අදාළ රාජ්‍ය අමාත්‍යාංශ හා පර්යේෂකයන් අවදි කළ යුතුය. සාම්ප්‍රදායිකත්වයට ප්‍රමුඛත්වය දෙමින් වුව ද නව තාක්ෂණ ඔස්සේ ඒවා රැකගනිමින් ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ ව්‍යාපෘතියක් ඇරඹීමත් දේශීය ඥානය පිළිබඳ පර්යේෂණ පුස්තකාලයක් ගොඩනගා ජාතික පුස්තකාල ඇතුලු සමස්ත පුස්තකාල පද්ධතිය සමඟ ජාලගත වීම මගින් ලංකාවේ දේශීය දැනුම වෙත විදේශීය සංචාරක අවධානය යොමුකරවාගෙන ආර්ථික වශයෙන් වාසි අත්පත් කරගැනීමේ ක්‍රියාකාරකම් සංවිධානය කොට පුස්තකාල ප්‍රබලව මුහුණදෙන මූල්‍යමය ප්‍රතිපාදන හිඟ කමට පවා නිර්මාණාත්මක විසඳුම් ලබාගැනීමට හැකිවනු ඇත.

**පරිශීලන නාමාවලිය**


- අංකුඹුර, මුදිතා (2016) **ශ්‍රී ලාංකේය අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමය**, කොළඹ.
- රණසිංහ, පියදාස, (2014) **ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පියදාස රණසිංහ අභිනන්දන ග්‍රන්ථය** : (eds), පි. 194-203. කර්තෘ, රාගම.
- International consultation on new perspectives for UNESCO'S Programme : **The Intangible Heritage** (1993) 16/17-06-1993, Paris (France).Retrieved From http://www.unesco.org/ indigenoï-peoples/ich/index.php? meeting_id00077


Scanned with CamScanner